**දිවි නැගුම අරමුදල - 2016**

**-----------------------------**

දිවි නැගුම අරමුදලේ 2016 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2013 අංක 1 දරන දිවි නැගුම පනතේ 45 වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (3) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. යථෝක්ත මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

**------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.3 විගණකගේ වගකීම

**-----------------------**

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000 – 1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදුකරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාළවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම් ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අරමුදලේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැළකිල්ලට ගන්නා නමුත් අරමුදලේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගැයීමද විගණනයට ඇතුළත් වේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

**-----------------------------------------------**

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

## 2. මූල්‍ය ප්‍රකාශන

### 2.1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2016 දෙසැම්බර් 31 දිනට දිවි නැගුම අරමුදලේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 2.2 මූල්‍ය ප්‍රකාශය පිළිබඳ අදහස් දැක්වීම

#### 2.2.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති

ප්‍රමිති අංක 03 හි 07 වැනි ඡේදය ප්‍රකාරව ගනුදෙනු අනෙකුත් සිදුවීම් සහ තත්ත්වයන් ඒවා සිදුවන අවස්ථාවේදී හඳුනාගෙන අදාළ කාලපරිච්ඡේදයේ මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් කළ යුතුයි. එසේ වුවද, සමෘද්ධි ප්‍රජාමුල බැංකු හා බැංකු සමිති පවත්වාගෙන යන ගොඩනැගිලි 1286 කින් ලැබිය යුතු කුලී ආදායම රු. 15,432,000 ක් මූල්‍ය ප්‍රකාශනවල දක්වනු වෙනුවට උපලබ්ධි වූ තත්‍ය ආදායම රු. 12,226,000 ක් පමණක් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

#### 2.2.2 ගිණුම්කරණ අඩුපාඩු

ඉකුත් වර්ෂවල ආදායම් උත්පාදන ව්‍යාපෘති වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේදී ලැබුණු රු. 617,617 ක මුදල ලැබියයුතු මුදල් ශේෂයට ගැලපීම් නොකොට වර්ෂයේ ආදායමක් ලෙස ගිණුම් ගතකර තිබුණි.

#### 2.2.3 විගණනය සඳහා සාක්ෂි නොවීම

ධීවර හා සත්වපාලන ලැබිය යුතු ශේෂය සහ සහ කෘෂි ලැබිය යුතු ශේෂය යන ගිණුම් විෂයයන් දෙකක එකතුව රු. 17,412,473 ට අදාල උපලේඛන හා ශේෂ සනාථ කිරීම් පිළිබඳ ලිඛිත සාක්ෂි විගණනයට ඉදිරිපත් නොකෙරුණි.

### 2.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

2014 වර්ෂයේදී දැයට කිරුළ වැඩසටහනට සමගාමීව දිස්ත්‍රික්ක 03 ක සංවර්ධන කටයුතු වෙනුවෙන් මහා භාණ්ඩාගාරයෙන් ප්‍රතිපූර්ණය කිරීමේ පදනම මත ලබා දී තිබූ රු. 212,000,000 ණය මුදල විගණිත දින වන විටත් ප්‍රතිපූර්ණය කරවා ගැනීමට කටයුතු කර නොතිබුණි.

### 2.4 නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

2006 දෙසැම්බර් 22 දිනැති අංක පීඑෆ්/423 චක්‍රලේඛය සහ 2020 අගෝස්තු 28 දිනැති අංක 01/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය මගින් ප්‍රකාශිත මුදල් රෙගුලාසි 876(3) ප්‍රකාරව අරමුදල ව්‍යවස්ථාපිත කිරීමට කටයුතු කර නොතිබූ අතර දිවිනැගුම (සමෘද්ධි) සංවර්ධන දෙපාර්තමේන්තුව යටතේ මෙම අරමුදල තවදුරටත් පවත්වාගෙන යාමේ අවශ්‍යතාවය පිළිබඳ සමාලෝචනය කර නොතිබුණි.

## 3. මූල්‍ය සමාලෝචනය

## 3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා අරමුදලේ මූල්‍ය ප්‍රතිඵලය රු.114,506,350 ක අතිරික්තයක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු. 87,064,477 ක් වූයෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 27,441,873 ක වර්ධනයක් පෙන්නුම් කෙරුණි. ආයෝජන පොලී ආදායම ඇතුළුව මුළු අයභාරය රු. 58,341,814 කින් වැඩිවීම මෙම වර්ධනය කෙරෙහි ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

## 4.1 කාර්යසාධනය

**පහත නිරීක්ෂණයන් කරණු ලැබේ.**

(අ) සමෘද්ධි ප්‍රජාමූල බැංකු හා බැංකු සමිති ගොඩනැඟීමට අවශ්‍ය මූල්‍ය පහසුකම් සම්පාදනය කිරීම මෙම අරමුදලේ එක් කාර්යයක් වුවත් දිවයින පුරා පිහිටි ප්‍රජාමූල බැංකු/ බැංකු සමිති 1286 කින් සමාලෝචිත වර්ෂයේදි බැංකු සමිති 13 ක් ඉදිකිරිමට හා බැංකු සමිති 9 ක් අළුත්වැඩියා කිරිම සඳහා රු. 25,747,492 ක් වැයකර තිබුණි. ඒ අනුව එම කාර්යය සඳහා වාර්ෂික ආදායමෙන් වැයකර ඇති ප්‍රතිශතය සියයට 17.19 ක අඩු අගයක් විය.

(ආ) සමාලෝචිත වර්ෂය සඳහා අදාළ ව්‍යාපෘති ආදායම් හා කුලී ආදායම් නිසි පරිදි ගණනය කර අයකර ගැනීමට කටයුතු කර නොතිබුණු අතර දිවයින පුරා ක්‍රියාත්මක ව්‍යාපෘතිවලින් ලැබෙන ආදායම් ආයෝජනය/ ප්‍රති ආයෝජනය කර තිබූ බවට විගණනයේදී අනාවරණය නොවුණි.

## 4.2 කළමනාකරණ ක්‍රියාකාරකම්

මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ ජංගම වත්කම් යටතේ ලැබිය යුතු මුදල්වල ඇතුලත් එකතුව රු. 17,412,423 ක් වූ කෘෂි , ධීවර හා සත්ව පාලන ව්‍යාපෘති සඳහා සමෘද්ධි වැඩසටහන ආරම්භයේ සිට 2007 දක්වා භාණ්ඩාගාර ප්‍රතිපාදන මත සමෘද්ධි අධිකාරිය මගින් නැවත අයකිරීමේ පදනම මත ප්‍රතිලාභීන්ට චක්‍රීය පදනම මත ණය ලබාදී තිබුණි. මෙම ණය අයකිරීම් 2007 ජුලි 16 දිනැති අංක ස/අධි/10/ජාස.ගම්/ චක්‍රීය අරමුදල දරන සමෘද්ධි අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ උපදෙස් ප්‍රකාරව ප්‍රාදේශිය ලේකම් කාර්යාලවල "ගම් පුබුදු ජීවනෝපාය චක්‍රීය" ගිණුමට බැර කිරීමට නියෝගකර තිබුණද සමාලෝචිත වර්ෂය දක්වාම වාර්තා ඉදිරිපත් වීමක් හෝ ණය මුදල් පියවීමක් සිදු වී නොතිබුණි. මෙම හේතුවෙන් 2007 වර්ෂයෙන් පසු කිසිදු ආදායම් උත්පාදන ව්‍යාපෘතියකින් අරමුදලට මුදල් ලැබී නොතිබුණි.

## 5. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

## 5.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

2006 දෙසැම්බර් 22 දිනැති අංක පීඑෆ්/423 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය සහ 2020 අගෝස්තු 28 දිනැති අංක 01/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 15 ඡේදයේ ඇතුලත් මුදල් රෙගුලාසි 877(2)(ඇ) රෙගුලාසිය ප්‍රකාරව ගිණුම් වර්ෂය අවසන් වී මාස 02 ක් තුළ මූල්‍ය ප්‍රකාශන විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවද, සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන, වර්ෂ 05 ක කාලපමාවකින් පසුව 2021 ජුලි 14 දින ඉදිරිපත් කර තිබුණි.

**5.2 අයවැය ලේඛනමය පාලනය**

-------------------------------

2006 දෙසැම්බර් 22 දිනැති අංක පීඑෆ්/423 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 4.1 ඡේදය හා 2020 අගෝස්තු 28 දිනැති අංක 01/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 15 ඡේදයේ ඇතුලත් මුදල් රෙගුලාසි 877(1) රෙගුලාසිය ප්‍රකාරව අරමුදලේ කටයුතු සම්බන්ධයෙන් අයවැය ලේඛනයක් සකස් කර නොතිබුණි.

**6. පද්ධති හා පාලනයන්**

----------------------

අරමුදල ව්‍යවස්ථාපිත කිරීම තුළින් අභ්‍යන්තර පාලන ක්‍රමවේදයන් ස්ථාපිත කර පොත්පත් හා වාර්තා ක්‍රමානුකූලව පවත්වා ගැනීම හා විධිමත් පරිදි මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතුය.